**ශීර්ෂය 162 - මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය පිළිබඳව විගණකාධිපති වාර්තාව 2016 වර්ෂය**

---

ශීර්ෂය 162 - මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2017 ඔක්තෝබර් 06 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයාගැනීම් විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම මත පදනම්වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය හා ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම**

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්,වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වාගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

---

**2.1 විසර්ජන ගිණුම**

---

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

---

අමාත්‍යාංශය සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 30,159.85ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 13,151.30ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශය වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 17,008.55 ක් හෙවත් සියයට 56.39 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2016 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 1,066.07 | 750.59 | 315.48 | 29.59 |
| මූලධන | 29,093.78 | 12,400.71 | 16,693.07 | 57.38 |
| එකතුව | **30,159.85** | **13,151.30** | **17,008.55** | **56.39** |

## 2.2 රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශයට අදාළ විෂය අංක 16201 යටතේ රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 8.50 | 6.38 | 3.50 | 3.54 | 30.00 | 15.94 |

## 2.3 පොදු තැන්පත් ගිණුම්

අමාත්‍යාංශය යටතේ වන තැන්පතු ගිණුම් දෙකක 2016 දෙසැම්බර් 31 දිනට ශේෂ එකතුව රු.මිලියන 154.07 ක් වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| තැන්පත් ගිණුමේ අංකය | 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|
| | රු.මිලියන |
| 6000/0000/00/0016/0084/000 | 0.10 |
| 6000/0000/00/0020/0014/000 | 153.97 |
| **එකතුව** | **154.07** |

## 2.4 විගණන නිරීක්ෂණය

මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 03 ඡේදයේ සඳහන් කර ඇත.

## 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්‍ෂණ

---

### 3.1 විගණන විමසුම්වලට පිළිතුරු දීම

---

අමාත්‍යාංශය වෙත සමාලෝචිත වර්ෂයට අදාළව ඉදිරිපත් කරන ලද විගණන විමසුම් 03 කට 2017 දෙසැම්බර් 10 දින වන විටත් පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. එම විමසුම්වලට අදාළ ගණනය කළ හැකි ගනුදෙනුවල වටිනාකම රු.මිලියන 332.89ක් වී තිබුණි.

### 3.2 විසර්ජන ගිණුම

---

**අයවැය විචලනය**

---

වැය විෂයයන් 3 ක් සඳහා එකතුව රු.මිලියන 3,327.70 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර, එම ප්‍රතිපාදන උපයෝජනය කිරීම සඳහා අවශ්‍ය ප්‍රමාණවත් අග්‍රිම භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් ලබා දී නොතිබුණි. මේ නිසා එම වැය විෂයයන් 03 සඳහා සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් රු.මිලියන 1,378.02 ක් පමණක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව එම වැය විෂයයන් 03 සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 53.33 ක සිට සියයට 78.16 ක් දක්වා පරාසයක ප්‍රමාණයක ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි.

### 3.3 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

---

#### 3.3.1 අභ්‍යන්තර විගණනය

---

අභ්‍යන්තර විගණන ඒකකය විසින් නිකුත් කර තිබුණු අභ්‍යන්තර විගණන විමසුම් 04 කින් පෙන්වා දී තිබුණු අඩුපාඩු නිවැරදි කිරිමට අමාත්‍යාංශය විසින් සමාලෝචිත වර්ෂයේදී කටයුතු කර නොතිබුණි. අමාත්‍යාංශයේ නිලධාරීන් දෙදෙනෙකු විසින් රු.1,530,650 ක් අයථා ලෙස ලබාගෙන තිබුණු අතර ඉන් රු.1,340,650 ක් පමණක් එම නිලධාරීන්ගෙන් ආපසු අයකර ගෙන තිබුණි. ඉතිරි රු.190,000 ක් ආපසු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

#### 3.3.2 විගණන හා කළමනාකරණ කමිටුව

---

සමාලෝචිත වර්ෂයේදී විගණන හා කළමනාකරණ කමිටුවේ රැස්වීම් වාර 04 ක් පවත්වා තිබුණි. විගණන විමසුම් මඟින් පෙන්වා දී තිබුණු වැඩිපුර ගෙවා තිබුණු එකතුව රු.1,906,200 ක් අයකර ගත යුතු බව විගණන හා කළමනාකරණ කමිටුව තීරණය කර තිබුණත්, එම මුදල අයකර ගැනීමට අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් සමාලෝචිත වර්ෂයේ ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

#### 3.3.3 වාර්ෂික කාර්යසාධන වාර්තාව

---

2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත අමාත්‍යාංශයේ කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, 2015 හා 2016 වර්ෂ සඳහාවූ කාර්යසාධන වාර්තාව 2017 ඔක්තෝබර් 30 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

## 3.4 වත්කම් කළමනාකරණය

**වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය**

කොළඹ අගනගර ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතිය යටතේ භාණ්ඩ සම්බන්ධයෙන් සිදු කරන ලද වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයට අනුව වර්ග 04 කට අයත් වන ජංගම දුරකථන, පරිගණක මොනිටර් ආදි භාණ්ඩ අයිතම 04 ක ඌණතාවයක් අනාවරණය වී තිබුණි. එසේම ව්‍යාපෘතිය මගින් අනුගමනය කරනු ලබන දුර්වල ඉන්වෙන්ට්‍රි පාලන ක්‍රම හේතුවෙන් වැඩි වටිනාකමින් යුත් භාණ්ඩ ආරක්ෂා කිරීම සඳහා වගකිවයුතු නිලධාරින් පත් කොට නොමැති බවද නිරීක්ෂණය විය.

## 3.5 අනුකූල නොවීම

**නිති, රිති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදි නිරීක්ෂණය වු නීති, රිති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රාහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම<br>රු.මිලියන | අනුකූල නොවීම |
|---|---|---|
| **(අ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ** | | |
| (i) 2009 ජුනි 17 දිනැති අංක 09/2009/01 දරන චක්‍රලේඛය | 0.75 | අමාත්‍යාංශයේ මාධ්‍ය ලේකම්වරයා වෙත සමාලෝචිත වර්ෂයේදී වැටුප් හා දීමනා වශයෙන් එකතුව රු.749,216 ක් ගෙවා තිබුණත්, ඔහු විසින් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කිසිදු දිනයක ඇඟිලි සළකනු යන්ත්‍රය මගින් පැමිණීම හා පිටවීම සනාථ කර නොතිබුණි. |
| (ii) 2016 මාර්තු 09 දිනැති අංක 05/2016 දරන චක්‍රලේඛයේ 2(iv) ඡේදය | 0.75 | අමාත්‍යාංශයේ නිලධාරින්ට වෙන්කළ වාහන සඳහා ලබාගත් ඉන්ධන බිල්පත් චක්‍රලේඛ විධිවිධානවලට පටහැනිව අමාත්‍යාංශය යටතේ වු කොළඹ අගනගර ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතියේ සහ උපායමාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතියේ අරමුදල්වලින් ගෙවීම් කර තිබුණි. |
| **(ආ) කළමනාකරණ සේවා චක්‍රලේඛ** | | |
| (i) 2011 දෙසැම්බර් 24 දිනැති අංක 46 දරන චක්‍රලේඛය | 10.83 | පූර්ණ කාලීන හා අර්ධ කාලීන වශයෙන් ව්‍යාපෘති කාර්යයන් සඳහා මුදාහැර තිබුණු කාර්ය මණ්ඩලයට චක්‍රලේඛ |

විධිවිධාන ප්‍රකාරව සියයට 5 ක් හා සියයට 15 ක් වශයෙන් විශේෂ දීමනා හිමි නොවන නමුත් කොළඹ අගනගර ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතියට පූර්ණ කාලීනව හා අර්ධ කාලීනව මුදාහැර තිබුණු කාර්ය මණ්ඩලයට එම දීමනා ගෙවා තිබුණි.

| | | | |
|---|---|---|---|
| (ii) | 2016 මාර්තු 24 දිනැති අංක 01/2016 දරන චක්‍රලේඛය | - | ව්‍යාපෘති අධීක්‍ෂණ කමිටු රැස්වීම් මාස 2කට වරක් පැවැත්විය යුතු වුවත්, කොළඹ අගනගර ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතිය මඟින් සමාලෝචිත වර්ෂය සඳහා එක් රැස්වීමක් පමණක් පවත්වා තිබුණි. |
| (iii) | 2016 මාර්තු 24 දිනැති අංක 01/2016 දරන චක්‍රලේඛය | - | ව්‍යාපෘති අධීකෂණ කමිටු රැස්වීම් මාස 02 කට වරක් පැවැත්විය යුතු වුවත්, උපාය මාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතියේ සමාලෝචිත වර්ෂයේදි අධීකෂණ කමිටුවේ රැස්වීම් පවත්වා නොතිබුණි. එසේම එම කමිටුව සඳහා අදාළ මහ නගර සහා, නාගරික සංවර්ධන අධිකාරිය, වාරිමාර්ග දෙපාර්තෙමේන්තුව සහ ජාතික ජල සම්පාදන හා ජල ප්‍රවාහන මණ්ඩලය යන ආයතන වල නියෝජිතයින් ඉහත සඳහන් කමිටුවට ස්ථිර පදනම මත පත්කර නොතිබුණි. එබැවින් ඉහත සඳහන් නියෝජිතායතන අතර වගකීම් බෙදාහැරීම මඟින් ව්‍යාපෘතියේ මෙහෙයුම් පහසුකර ගැනීම සඳහා කමිටු රැස්වීම්වලදි ඵලදායී තීරණයන් ගැනීමට නොහැකි වී තිබුණි. |

**3.6 විදේශාධාර ව්‍යාපෘති**

-----------------------

සමාලෝචිත වර්ෂයේදී අමාත්‍යාංශය විසින් විදේශ මුලාණය යටතේ ව්‍යාපෘති 04 ක් ක්‍රියාත්මක කර තිබුණි. ණය ගිවිසුම් අනුව එහි ඇස්තමේන්තුගත පිරිවැයවල එකතුව රු.මිලියන 77,741ක් වී තිබුණු අතර, සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 4335.8 ක් උපයෝජනය කර තිබුණි. එම විදේශාධාර ව්‍යාපෘති සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්‍ෂණයන් කරනු ලැබේ.

**(අ) කොළඹ අගනගර ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතියේ කාර්යසාධනය**

---------------------------------------------------------------------------

කොළඹ අගනගර ආශ්‍රිත ගංවතුර සහ අපවහන ජල කළමනාකරණ සහ පළාත් පාලන ආයතනවලට සහය දැක්වීමේ යන උපාංග දෙක යටතේ ව්‍යාපෘතිය විසින් වැඩසටහන් 59 ක්

ක්‍රියාත්මක කිරීමට කටයුතු කර තිබුණි. සමාලෝචිත වර්ෂයේදී එම උපාංග යටතේ දියත් කරන ලද කාර්යයන්වල අවම කාර්යසාධනයක් නිරීක්ෂණය වූ අතර ඒ යටතේ පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

(i) ගංවතුර සහ ජල කළමනාකරණ උපසංරචකය යටතේ ක්‍රියාත්මක කිරීමට නියමිතව තිබුණු රු.මිලියන 5,636 කට සමාන ඇ.ඩො.මිලියන 43.03 ක ඇස්තමේන්තු සහ පුනස්ථාපන කටයුතු 09 ක් සමාජ හා පාරිසරික ගැටළු මත තවදුරටත් සැලැසුම් අදියරයේ පැවතුණි.

(ii) අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරන කොළඹ අගනගරය ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතිය විසින් කොළඹ අගනගරයට දෛනිකව රැස්වෙන ඝන අපද්‍රව්‍ය බැහැර කිරීම හා අපද්‍රව්‍ය කළමනාකරණය සිදු කර තිබුණි. මෙම ව්‍යාපෘතියේ උපසංරචක (Sub Component) යටතේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණයේදී පරිසරයට වන බලපෑම තක්සේරු කිරිමේ වාර්තාවක් සහ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා ක්‍රියාකාරි සැලසුමක් පිළියෙල කළ යුතුව තිබුණි. මේ සඳහා ජාත්‍යන්තර උපදේශන ආයතනවල සහය ලබාගෙන ඒ වෙනුවෙන් උපදේශන ගාස්තු ලෙස රු.මිලියන 65 කට අධික මුදලක් ව්‍යාපෘතිය විසින් වැය කර තිබුණි. කෙසේ වුවද, එලෙස මුදල් වැයකර ලබාගත් වාර්තාවලින් පෙන්වාදෙන ලද කරුණු හා නිර්දේශයන් ක්‍රියාත්මක කිරිම පිණිස එකී වාර්තා අමාත්‍යාංශය යටතේ පිහිටුවා ඇති අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය වෙත ලබාදීමට හෝ ඒ සම්බන්ධයෙන් සම්බන්ධීකරණයක් ඇතිකිරිමට හෝ අමාත්‍යාංශය කටයුතු කර නොතිබුණි. මේ නිසා උපදේශන ආයතනවල සහය ඇතිව පිළියෙල කරන ලද වාර්තාවල සඳහන් යෝජනා ක්‍රියාත්මක කිරීමට නොහැකි වී තිබුණි. ඒ අනුව උපදේශක ආයතනවලට ගෙවන ලද රු.මිලියන 65 ක් නිෂ්කාර්ය වියදමක් බවට පත්ව තිබුණි.

(iii) ව්‍යාපෘතියෙන් ලද තොරතුරු අනුව, ඉදිකිරීම් කොන්ත්‍රාත් 40 ක් සහ උපදේශක සේවා කොන්ත්‍රාත් 11ක් සඳහා පිළිවෙලින් රු.මිලියන 14,942 ක් හා රු.මිලියන 151ක ඇස්තමේන්තුගත පිරිවැයකට කොන්ත්‍රාත්තු ප්‍රදානය කර තිබුණි. කොන්ත්‍රාත්කරුවන්ගේ මූල්‍ය හා තාක්ෂණික හැකියාවන් තහවුරු කර ගැනීමෙන් තොරව කොන්ත්‍රාත්කරුවන් තෝරා ගැනීම, උපදේශකයින් විසින් සැකසූ සැලැසුම්වල දුර්වලතා, සැලැසුම් හා උපමානයන් වෙනස් කිරීම්, අවිධිමත් ඇස්තමේන්තු සැලැසුම් කිරීම හා ඉදිකිරීම කොන්ත්‍රාත් පරිපාලන දුර්වලතා නිසා එම කොන්ත්‍රාත්වල කාර්යසාධනය ඉතා පහළ මට්ටමක පැවතුණි.

(iv) ගංවතුර අවදානම අවම කිරීම සඳහා බැද්දගාන ජෛව විවිධත්ව උද්‍යානය ඉදිකිරීම සිදු කර තිබුණත්, ගංවතුර අවදානම හා පාරිසරික බලපෑම් පිළිබඳ ඇගයීම් සිදුකර නොතිබුණි. තවද නිසි අධ්‍යයනයකින් තොරව ප්‍රමාණ බිල්පත් සහ ඉංජිනේරු ඇස්තමේන්තු සකස් කර තිබුණු අතර සම්පූර්ණ කරන ලද ඉදිකිරීම් කටයුතු ඉදිකිරීම් භාර උපදේශක විසින් සහතික නොකර ව්‍යාපෘතියේ සේවයේ නියුතු විශ්‍රාමික කාර්මික නිලධාරියෙකු විසින් සහතික කර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස ඉටු නොකරන ලද වැඩ ප්‍රමාණයන් සහ වැරදි ගණනය කිරීම් හේතුවෙන් කොන්ත්‍රාත්කරුට රු. මිලියන 92 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(v) මට්ටක්කුලිය බීච් පාර්ක් ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව රු.මිලියන 275ක ඇස්තමේන්තුගත පිරිවැයකට ප්‍රදානය කිරීම සඳහා 2014 සැප්තැම්බර් 23 දින කොන්ත්‍රාත්කරුවෙකු සමඟ ගිවිසුම්වලට එළඹ තිබුණි. එම ගිවිසුම අනුව කොන්ත්‍රාත්තුව 2015 ජූලි මාසය වන විට අවසන් කිරීමට එකඟ වී තිබුණි. නමුත් එම කොන්ත්‍රාත්තුව, කොන්ත්‍රාත්කරුගේ අසාර්ථකත්වය හේතුවෙන් 2016 දෙසැම්බර් 31 දින අත්හිටුවා තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විට එම කොන්ත්‍රාත්තුව වෙනුවෙන් රු.මිලියන 183ක් වැය කර තිබුණු අතර ප්‍රමාණ බිල්පත්වල ඇතුළත් කර තිබුණු වැඩ අයිතම 47 ක් සම්පූර්ණ කර නොතිබුණි.

(vi) කොන්ත්‍රාත් 17 කට අයත් වැඩ කොටස් නිම කිරීමට රු.මිලියන 4,553.75 ක පිරිවැය ඇස්තමේන්තු පිළියෙල කර තිබුණි. නමුත් එම වැඩ කොටස් එකතුව රු.මිලියන 3,657 ක පිරිවැයකට නිමකර තිබුණි. ඒ අනුව ව්‍යාපෘතිය විසින් යථාර්තවාදී නොවන ඇස්තමේන්තු සකස් කර තිබුණු බව නිරීක්ෂණය විය. එසේම, කොන්ත්‍රාත් 30 ක් ඉටු කිරීම සඳහා එකතුව රු.මිලියන 9,017 ක පිරිවැය ඇස්තමේන්තු අනුව කොන්ත්‍රාත්කරුවන්ට කොන්ත්‍රාත්තු ප්‍රදානය කර තිබුණි. නමුත් එම කොන්ත්‍රාත්කරුවන්ගේ තාක්ෂණික හැකියාවන් සහ ඔවුන් සතු සම්පත් පිළිබඳ ඇගයීමක් නොකර ව්‍යාපෘතිය විසින් කොන්ත්‍රාත්තු ප්‍රදානය කිරීම නිසා එම කොන්ත්‍රාත්තු මාස 01 ක සිට මාස 14 ක් දක්වා කාල පරාසයකින් නිම කිරීමේ දින, දීර්ඝ කර තිබුණි.

(vii) කාලය හා බැඳුණු ගංවතුර කළමනාකරණය කිරීමේ පද්ධතියක් සැලැසුම් කර ක්‍රියාත්මක කිරීම සඳහා වූ උපදේශක සේවා කොන්ත්‍රාත්තුවක් එ.ජ.ඩො.38,000 කට සමාන රු.මිලියන 4.98 ක ඇස්තමේන්තුගත පිරිවැයකට ව්‍යාපෘතිය විසින් කොන්ත්‍රාත්කරුවෙකු වෙත ප්‍රදානය කර තිබුණද, අදාළ වැඩ කටයුතුවල ප්‍රගති වාර්තා විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(viii) බෙරේ වැව දිගට උද්‍යානයක් ඉදිකිරීම (අදියර II), දේවී බාලිකා විද්‍යාලය අසල ඇල මාර්ගයක් ඉදිකිරීම, මාදිවෙල දකුණු දොරටුව (අදියර I) සංවර්ධනය හා කොලොන්නාව නගර සභා බල ප්‍රදේශය සංවර්ධනය (අදියර I) යන ඉදිකිරීම් කටයුතුවලින් 2016 දෙසැම්බර් 31 දිනට සියයට 25 ක භෞතික ප්‍රගතියක් ළගාකර ගැනීමට සැලැසුම් කර තිබුණි. ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු ප්‍රමාදවීම නිසා එදින වන විට එහි භෞතික ප්‍රගතිය සියයට 5 ක් පමණ වී තිබුණි.

(ix) ව්‍යාපෘති අධ්‍යක්ෂ, ඉංජිනේරු විශේෂඥ හා ජ්‍යේෂ්ඨ ඉංජිනේරු (ප්‍රසම්පාදන) සහ සැලසුම් ශිල්පීන් වැනි ව්‍යාපෘතියේ ප්‍රධාන තනතුරු 04 ක් වර්ෂය පුරාම පුරප්පාඩු වී තිබුණු අතර විශේෂඥ දැනුම සහිත කාර්ය මණ්ඩලයේ හිඟය ව්‍යාපෘතියේ කාර්යසාධනයට බලපා තිබුණි. මීට අමතරව තාක්ෂණික නිලධාරීන් 05 දෙනෙකු හා මිනුම් නිලධාරියකු කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව බඳවා ගෙන සමාලෝචිත වර්ෂයේදී ඔවුන් වෙනුවෙන් රු.මිලියන 06ක වැටුප් හා දීමනා ගෙවා තිබුණි.

**(ආ) උපාය මාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතිය**

**-----------------------------------------------------**

මෙම ව්‍යාපෘතිය යටතේ වූ සංරචකයන් සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණනයේදී පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ව්‍යාපෘති ශක්‍යතා ලියවිල්ලේ 10 වන ඡේදය ප්‍රකාරව මධ්‍ය ප්‍රතිඵල දර්ශක ප්‍රකාශනයක් පිළියෙල කර නොතිබුණි. ව්‍යාපෘති ශක්‍යතා ලියවිල්ලේ 33 (ඊ) ඡේදයේ සඳහන් ප්‍රසම්පාදන කාර්යසාධන දර්ශකයන් පදනම් කරගෙන ව්‍යාපෘතියේ ප්‍රසම්පාදන කටයුතුවල ප්‍රගතිය ඇගයීමට හැකිවන පරිදි ව්‍යාපෘති ශක්‍යතා ලියවිල්ලේ 24 ඡේදය ප්‍රකාරව ප්‍රසම්පාදන පරිපාලන අත්පොතක් පිළියෙල කර නොතිබුණි.

(ii) ණය සපයනු ලබන නියෝජිතායතනය විසින් මෙම ව්‍යාපෘතිය සඳහා එ.ජ.ඩො.මිලියන 147 ක් හෙවත් රු.මිලියන 19,257 කට සමාන අරමුදල් වලින්, 2016 දෙසැම්බර් 31 දින වන විට ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ කර වර්ෂ 02 ½ ක කාලයක් ඉක්මවා තිබුණත්, ප්‍රතිපාදන උපයෝජනය සියයට 7 ක් හෙවත් රු.මිලියන 1,563.58 කට සමාන එජඩො මිලියන 11 ක් පමණක් වී තිබුණි. තවද , සමස්ථ ව්‍යාපෘති කාලපරිච්ඡේදය ආවරණය වන පරිදි මාසික, කාර්තුමය හා අර්ධ වාර්ෂිකව මූල්‍ය හා භෞතික ඉලක්ක සඳහන් අදාළ නිලධාරීන්ට වගකීම පැවැරෙන ආකාරයට විස්තරාත්මක ක්‍රියාකාරි සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. මෙම නිසා වෙන්කරන ලද අරමුදල් උපයෝජනය පහළ මට්ටමක පැවතුණි.

(iii) තවද ව්‍යාපෘති ශක්‍යතා ලියවිල්ලේ II ඡේදය පරිදි ව්‍යාපෘතියේ වැඩ සැලැස්ම පදනම් කරගෙන සමාලෝචිත වර්ෂය සඳහා විස්තරාත්මක අයවැය ලේඛනයක් පිළියෙලකර නොතිබුණි. එම නිසා සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික අයවැය ඇස්තමේන්තුව මඟින් සලසා තිබුණු රු.මිලියන 5,810 ක ප්‍රතිපාදනවලින් රු.මිලියන 1,624 ක් පමණක් උපයෝජනය කර තිබුණි.

(iv) ලබාගත් තොරතුරුවලට අනුව, මහනුවර හා ගාල්ල නගරවල තෝරාගත් නාගරික සේවා හා පොදු නාගරික ස්ථාන වැඩි දියුණු කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී වැඩසටහන් කිහිපයක් ක්‍රියාත්මක කිරීමට ව්‍යාපෘතිය කටයුතු කර තිබුණි. එසේ වුවත්, අතිරේක මූල්‍යනය වැඩපිළිවෙල යටතේ ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වූ යාපනය නගරය සංවර්ධනය කිරීමේ කටයුතු 2016 දෙසැම්බර් 31 දින වන විටත් ආරම්භ කර නොතිබුණි.

(v) කටුගස්තොට - මඩවල - දිගන මාර්ගය සහ මහනුවර ධර්මාශෝක යන මාර්ග නැවත ඉදිකිරීම් කොන්ත්‍රාත්තුවල වැඩ 2016 ජූලි මාසයේදී ආරම්භකර තිබුණි. නමුත් කොන්ත්‍රාත්කරුවන්ගේ දුර්වල කාර්යසාධනය හේතුවෙන්, 2016 දෙසැම්බර් 31 දින වන විට එම ඉදිකිරීම්වල පිළිවෙලින් සියයට 27 ක් හා සියයට 9 ක පහළ කාර්යසාධනයක් පෙන්නුම් කර තිබුණි. එසේම, මහනුවර නගරයේ පොළව යටින් දිවෙන කිලෝමීටර් 2 ක් දිගැති කානු පද්ධතිය 2016 දෙසැම්බර් 31 දින වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණද, එම දිනය වන විට එහි භෞතික ප්‍රගතිය සියයට 25 කට වඩා අඩු වී තිබුණි.

(vi) ව්‍යාපෘතියෙහි ආයතනික බලගැන්වීම් සහ ධාරිතා සංවර්ධන සංරචකය යටතේ කළ යුතුව තිබුණු කාර්යයන් සහ ගාල්ල මහනගර සභාවේ ප්‍රයෝජනය සඳහා වන ප්‍රසම්පාදන කටයුතු සමාලෝචිත වර්ෂයේදී ක්‍රියාත්මක කර නොතිබුණි.

(vii) ව්‍යාපෘතියේ උප ව්‍යාපෘතියක් මඟින් මහනුවර නගරයෙහි ක්‍රියාත්මක කර තිබුණු කොන්ත්‍රාත් 07 ක් සඳහා එකතුව රු.මිලියන 609.72 කට සමාන එ.ජ.ඩො. මිලියන 4.07 ක ඇස්තමේන්තුගත පිරිවැයක් යටතේ සමාලෝචිත වර්ෂයේදී නිම කිරීමට සැලැසුම් කර තිබුණද, කොන්ත්‍රාත්කරුගේ දුර්වල කාර්යසාධනය හේතුවෙන් 2017 මාර්තු 31 දින වන විටත් එම උප ව්‍යාපෘති නිම කර නොතිබුණි.

(viii) මහනුවර නගරයෙහි ක්‍රියාත්මක කිරීමට සැලැසුම්කර තිබුණු වෙනත් ව්‍යාපෘති 07 ක් වෙනුවෙන් එකතුව රු.මිලියන 2,690.11 කට සමාන එ.ජ.ඩොලර් මිලියන 17.96 ක පිරිවැය ඇස්තමේන්තුවක් පිළියෙල කර තිබුණත්, ඒ සඳහා ජාත්‍යන්තර සංවර්ධන ආයතනයේ එකඟතාවය නොලැබීම නිසා එම ව්‍යාපෘති අවලංගු කර තිබුණි. එම ව්‍යාපෘති යටතේ සමාලෝචිත වර්ෂයේදී ක්‍රියාත්මක කර නිම කිරීමට අපේක්ෂා කර තිබුණු රු.මිලියන 858.26 කට සමාන එ.ජ.ඩොලර් මිලියන 5.73 ක ඇස්තමේන්තු කළ උප ව්‍යාපෘති 04 ක් ක්‍රියාත්මක කිරීමට නොහැකි වී තිබුණි.

(ix) ප්‍රගති වාර්තා අනුව, රු.මිලියන 22,020 කට සමාන එ.ජ.ඩොලර් මිලියන 147 ක ඇස්තමේන්තුගත පිරිවැයක් යටතේ මහනුවර හා ගාල්ල නගරවල පුනරුත්ථාපන කටයුතුවලට අදාළ කොන්ත්‍රාත්තු 76 ක් ප්‍රදානය කිරීමට සමාලෝචිත වර්ෂයේදී සැලැසුම් කර තිබුණි. එයින් රු.මිලියන 5,190 කට සමාන එ.ජ.ඩොලර් මිලියන 34.65 ක වටිනාකමක් සහිත කොන්ත්‍රත්තු 36 ක් 2016 දෙසැම්බර් 31 දින වන විට කොන්ත්‍රාත්කරුවන් වෙත ප්‍රදානය කර තිබුණි. ව්‍යාපෘතිය මඟින් ක්‍රියාත්මක කරන ලද කොන්ත්‍රාත්තු වැඩවල අඩු ප්‍රගතියක් වාර්තා කිරීම පොදු ලක්ෂණයක් වී තිබුණු අතර කොන්ත්‍රත්කරුවන්ගේ මූල්‍යමය ශක්‍යතාවය ඇගයීමකින් තොරව කොන්ත්‍රාත්කරුවන් තෝරා ගැනීම, කොන්ත්‍රාත්කරුවන් විසින් ප්‍රමාණවත් නොවන කාර්මික නිලධාරීන් සංඛ්‍යාවක් සේවයෙහි යෙදවීම ,සැලසුම් උපදේශකවරුන් පිළියෙල කළ සැලසුම්වල පැවති දෝෂ හා ව්‍යාපෘතිය මඟින් උපදෙස් ලබාදීමේ ප්‍රමාදයන් නිසා කොන්ත්‍රාත් වැඩවල කාර්යසාධනය දුර්වලවීමට හේතු වී තිබුණි.

(x) මහනුවර ධර්මාශෝක මාවත ප්‍රතිසංස්කරණය කිරීම සහ මැද ඇල ප්‍රදේශයේ ගේබියන් බැම් ඉදිකිරීම යන කොන්ත්‍රත්තුවලට අදාළව එළඹ තිබුණු ගිවිසුම් අනුව අතුරු බිල්පත්වල වටිනාකම කොන්ත්‍රාත් වටිනාකමෙන් සියයට 5 කට වඩා අඩු නොවිය යුතුව තිබුණි. නමුත් මුළු කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 5 කට අඩු වටිනාකමින් යුතුව ඉදිරිපත් කළ බිල්පත් සඳහා එම කොන්දේසි නොසලකා ගෙවීම් කර තිබුණි.

(xi) ව්‍යාපෘතියෙහි දුනුමඩලාව ජල පිරිපහදු යන්ත්‍රාගාරයෙහි ඉදිකිරීම් කටයුතුවල ප්‍රගතිය දුර්වල බව ව්‍යාපෘති උපදේශකවරයා විසින් වාර්තා කර තිබුණි. ව්‍යාපෘතිය විසින් කොන්ත්‍රාත්කරුගේ කාර්යසාධනය කඩිනම් කිරීමට හෝ කොන්ත්‍රාත් ගිවිසුම අනුව කොන්ත්‍රාත්තුව අවලංගු කිරීමට හෝ අවශ්‍ය කටයුතු කර නොතිබුණි. තවද මහනුවර නගරයේ ආතර් ඩෙක් ඉදිකිරීම් කටයුතු අවසන් කිරීමට මාස 09 ක කාලයක් ප්‍රමාද කර

තිබුණද ඒ සඳහා රු.මිලියන 2.7 ක ප්‍රමාද ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(xii) ව්‍යාපෘතියේ මූලික සැලැසුම්වලට අනුව රු.මිලියන 662 ක ඇස්තමේන්තුවක් යටතේ ඉඩම් කට්ටි 1,632 ක් අත්පත් කර ගැනීමට සැලැසුම් කර තිබුණි. එයින් ඉඩම් කට්ටි 1,267ක් සමාලෝචිත වර්ෂය අවසානය වන විට අත්පත් කරගෙන තිබුණි. ඉඩම් අත්පත් කර ගැනීමේ ප්‍රමාදය ව්‍යාපෘතියෙහි කාර්යයන් ක්‍රියාත්මක කිරීමේ අඩු මට්ටමක ප්‍රගතිය කෙරෙහි බලපා තිබුණි.

(xiii) ව්‍යාපෘති මගින් සමාලෝචිත වර්ෂයේදී ඉඩම් අත්පත් කර ගැනීම සඳහා එකතුව රු.මිලියන 378.46 ක වන්දි ගෙවා තිබුණි. 1950 අංක 9 දරන ඉඩම් අත් කර ගැනීමේ පනතේ 17 වගන්තිය ප්‍රකාරව ව්‍යවස්ථාපිත ගෙවීම් ලෙස ගෙවිය යුතු වූ රු.මිලියන 83.08 ක් ගෙවා තිබුණි. ඉතිරි රු.මිලියන 295.38 ක් ඉඩම් අත්පත් කර ගැනීමේ හා නැවත පදිංචි කිරීමේ කමිටුවේ නිර්දේශ පදනම් කරගෙන ගෙවා තිබුණි. ඊට අමතරව එම ඉඩම් හිමියන්ට රු.මිලියන 188.88 ක අතිරේක වන්දි ගෙවා තිබුණි. සහනදායි පදනම මත වන්දි ගෙවා තිබුණු මෙම ඉඩම් හිමියන්ටම එකතුව රු.මිලියන 188.88ක අතිරේක වන්දි ගෙවීමට හේතු වූ කරුණු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) **මහ කොළඹ ප්‍රදේශයේ ගංවතුර පාලනය සඳහා නාගරික පරිසර භාර අරමුදල**

**-------------------------------------------------------------------------------**

මෙම ව්‍යාපෘතිය යටතේ වූ සංරචකයන් පිළිබඳව සිදු කරන ලද නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

(i) සමාලෝචිත වර්ෂය අවසන් වන විට ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතු ආරම්භකර වර්ෂ 4 ක පමණ කාලයක් ගතවී තිබුණු අතර, එම කාල පරිච්ඡේදය තුළ රු.මිලියන 118.30 කට ආසන්න එ.ජ.ඩො.900,000 ක ප්‍රතිපාදන ලබා දී තිබුණි. එම ප්‍රතිපාදනවලින් සමාලෝචිත වර්ෂය අවසන් වන විට රු.මිලියන 35.44 ක් හෙවත් එ.ජ.ඩො.250,827 ක සමුච්චිත උපයෝජනයක් පමණක් සිදු කර තිබුණි.

(ii) කොළඹ අගනගරය ආශ්‍රිත ජලගැලීම් අවදානම තක්සේරු කිරීම, ජල ගැලීම් අවදානම අවම කිරීමේ උපායමාර්ග සකස්කිරීම හා නිර්දේශ ඉදිරිපත් කිරීම, තෙත්බිම් ප්‍රදේශ සංරක්ෂණය සඳහා ක්‍රියාකාරි සැලැස්මක් පිළියෙල කිරීම, වගුරු බිම්වල ජලයෙහි ගුණත්වය හා පස් පරීක්ෂා කිරීම භාර අරමුදලේ ප්‍රධාන කාර්යයන් සමාලෝචිත වර්ෂය අවසන් වන විට නිම කිරීමට සැලැසුම් කර තිබුණද , එම කාර්යයන් නිමකර නොතිබුණි.

(iii) භාර අරමුදලේ කටයුතු නියාමනය කිරීම හා ඇගයීම් පද්ධතිය සංවර්ධනය කිරීම තුළින් ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනවලට සහයවීමේ කටයුතු 2015 අගෝස්තු මාසය වන විට අවසන් කිරීමට අපේක්ෂා කර තිබුණි. නමුත් සමාලෝචිත වර්ෂය අවසන් වන විට එම කටයුතු ආරම්භ කර නොතිබුණි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් ව්‍යාපෘති කළමනාකරණය, ජ්‍රසම්පාදන මූල්‍ය පණිවුඩ හුවමාරුව, මහජනයා දැනුවත් කිරීම හා මෙහෙයවීම යන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනවලට සහායවීමට භාර අරමුදලට නොහැකි වී තිබුණි.

(iv) අවිධිමත් ප්‍රසම්පාදන ක්‍රියාපිළිවෙල හේතුවෙන් ගංවතුර පාලනය කිරීමේ උපායමාර්ග නිර්දේශ කිරීම හා ඒ සඳහා ක්‍රියාකාරි සැලස්ම පිළියෙල කිරීමේ උපදේශක සේවා කොන්ත්‍රාත්තුව මාස 18 ක් පමා වී 2016 මැයි 31 දින ප්‍රදානය කර තිබුණි. මේ හේතුවෙන් ප්‍රසම්පාදන සැලැස්ම අනුව කොන්ත්‍රාත්තුව නිම කිරීමේ කාලය මාස 21 කින් ප්‍රමාද වී තිබුණි.

**(ඈ) කඩවත, කඩුවෙල , කොට්ටාව නගර සංවර්ධන ව්‍යාපෘතිය (3K)**

**----------------------------------------------------------------------------------------------**

මෙම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරික්ෂාවේදී පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) මහ කොළඹ ප්‍රවාහන ජාල වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ නගර සංවර්ධන උපාංගය යන ව්‍යාපෘති සංවරකය සම්බන්ධයෙන් එළඹ තිබුණු ණය ගිවිසුම අනුව ව්‍යාපෘතිය 2015 මැයි 31 දින නිම කළ යුතුව තිබුණි. ව්‍යාපෘතිය යටතේ ඉටු කිරීමට සැලැසුම් කළ කාර්යයන් නියමිත කාල පරිච්ඡේදය තුළ ඉටු කිරිමට අපොහොසත් වී තිබුණි. සමාලෝචිත වර්ෂයේදී ව්‍යාපෘතියේ මාසයක පරිපාලන වියදම දළ වශයෙන් රු.මිලියන 1.4 ක් පමණ වී තිබුණි.

(ii) මෙම ව්‍යාපෘතියේ ව්‍යාපෘති අධ්‍යක්‍ෂකවරයා වෙනත් ව්‍යාපෘතියකද ව්‍යාපෘති අධ්‍යක්‍ෂකවරයා ලෙස කටයුතු කිරීම නිසා ව්‍යාපෘතිය තවදුරටත් කඩිනමින් නිම කිරීමට නොහැකි වන බව පැහදිලිවම අවබෝධ වී තිබුණත්, ව්‍යාපෘති අධ්‍යක්‍ෂවරයා උපායශීලිව බඳවා ගැනීමේ පරිපාටියට බැහැරව නගර සංවර්ධන ව්‍යාපෘතියේ අධ්‍යක්‍ෂවරයා ලෙසද කටයුතු කර තිබුණි.

(iii) ව්‍යාපෘතිය සඳහා ජපන් ජාත්‍යන්තර සහයෝගිතා ආයතනයෙන් (JICA) ලබාදෙන අරමුදල් 2015 වර්ෂයේදී නවතා තිබුණු බැවින් ව්‍යාපෘතියේ කටයුතු සම්පූර්ණයෙන්ම භාණ්ඩාගාර ප්‍රතිපාදනවලින් පවත්වා ගෙනයාමට සිදුවී තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේදී භාණ්ඩාගාරයෙන් ව්‍යාපෘතිය සඳහා රු.මිලියන 714.1 ප්‍රතිපාදන සලසා තිබුණු අතර එයින් රු.මිලියන 525 ක් උපයෝජනය කර තිබුණි.

(iv) මහ කොළඹ ප්‍රවාහන ජාල වැඩි දියුණු කිරීමේ සංරචකය (SL-P-89) යටතේ හඳුනාගන්නා ලද උප සංරචකවලින් 03 වන උප සංරචකය යටතේ මාකුඹුර බහුවිධ මධ්‍යස්ථානය ඉදිකිරීමට සැලැසුම් කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

- ව්‍යාපෘති යටතේ දුම්රිය හා බස් නැවතුම් පර්යන්තය එකම ස්ථානයක පිහිටුවා මඟින්ගේ ගමන් කාලය අඩුකිරීම සහ තදබදය අවම කිරීම අරමුණු කරගත් බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානය ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව රු.මිලියන 845 ක ඇස්තමේන්තුගත මුදලකට පෞද්ගලික ඉදිකිරීම් සමාගමක් වෙත 2015 මැයි 07 දින පවරා තිබුණි. එම ගිවිසුමට අනුව දින 168 කදී ඉදිකිරීම් කටයුතු නිමකළ යුතුව තිබුණත් 2017 ඔක්තෝබර් 31 දින වන විටත් ඉදිකිරීම් කටයුතු නිමකර නොතිබුණි.

- 2016 දෙසැම්බර් 31 දින වන විට ව්‍යාපෘතිය සඳහා සලසා තිබුණු රු.මිලියන 953 ක දේශිය අරමුදල් ප්‍රමාණය ඉක්මවා රු.මිලියන 18.3ක් වැයකර තිබුණි. නමුත්

ප්‍රවාහන මධ්‍යස්ථානය ඉදිකිරීම, ඉතිරි වැඩ කටයුතු ඉටු කිරීම, නඩත්තු හා කලමනාකරණ ක්‍රමවේදය ස්ථාපිත කිරීම සහ ප්‍රවාහන සැලැසුම් සකස් කිරීම යන කටයුතු ඇතුළත් කාර්යයන් 11 ක් ඉදිරි කාලයේදී නිමකල යුතුව තිබුණි. එම වැඩ කටයුතු සඳහා ඇස්තමේන්තු වටිනාකම ඉක්මවා තවත් රු.මිලියන 431 ක් වැය කිරීමට ඇස්තමේන්තු කර තිබුණි.

**(ඉ) විදේශාධාර ව්‍යාපෘතිවල ඇතුළත් සමහර උපසංරචක ක්‍රියාත්මක නොකිරීම**

පහත සඳහන් උපසංරචක ව්‍යාපෘති ක්‍රියාත්මක කර නොතිබුණි.

**(i) උපාය මාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතිය**

2016 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට සැලැසුම් කර තිබුණු ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 2,690.22ක් වූ කොන්ත්‍රාත් 07 ක් අවලංගු කර තිබුණු අතර රු.මිලියන 858.29 ක් ලෙස ඇස්තමේන්තු කළ කොන්ත්‍රාත් 04 ක වැඩ ආරම්භ කර නොතිබුණි.

**(ii) කොළඹ අගනගර ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතිය**

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

- ඇල මාර්ග පුනරුත්තාපනය හා සංවර්ධන කටයුතුවලට සම්බන්ධ රු.මිලියන 11,598 කට සමාන ඇ.ඩො.මිලියන 88.5 ක ඇස්තමේන්තුගත පිරිවැයකින් යුත් කොන්ත්‍රාත් 6 ක් විස්තරාත්මක සැලැසුම් පිළියෙල කිරීම් හා ඉඩම් අත්පත් කර ගැනීමේ ප්‍රමාදයන් හේතුවෙන් කොන්ත්‍රාත් පිරිනමා නොතිබුණි.

- රු.මිලියන 576.4 ට සමාන ඇ.ඩො..මිලියන 4.4 ක ඇස්තමේන්තුගත පිරිවැයකින් යුත් කෝට්ටේ බලකොටුව ජෛව විවිධත්ව උද්‍යානය සහ බේරේ වැව දිගේ (Liner Park) ලයිනර් පාර්ක් කොන්ත්‍රාත් කටයුතු 2016 දෙසැම්බර් 31 දින වන විටත් ආරම්භ කර නොතිබුණි.

## 3.7 දේශීය මූල්‍යකරණ මඟින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

### 3.7.1 ව්‍යාපෘති ආරම්භ නොකර අතහැර දැමීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව**

සංස්ථාව විසින් 2016 වර්ෂයේදී රු.මිලියන 361.87 ක ව්‍යාපෘති 13 ක් ක්‍රියාත්මක කිරීමට සැලැසුම් කර තිබුණි. නමුත් එම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමකින් තොරව ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර නොතිබුණු ව්‍යාපෘති 14 ක් ක්‍රියාත්මක කිරීම සඳහා රු.මිලියන 626.13 ක් වැය කර තිබුණි.

(ආ) **නාගරික සංවර්ධන අධිකාරිය**

---------------------------------

වාර්ෂික අයවැය ඇස්තමේන්තුව මගින් රේගීය අමාත්‍යාංශය හරහා නාගරික සංවර්ධන අධිකාරියේ ව්‍යාපෘති 22 ක් ක්‍රියාත්මක කිරිම සඳහා එකතුව රු. මිලියන 3,252.9 ක් ප්‍රතිපාදනය සලසා තිබුණි. නමුත් එම ව්‍යාපෘති 22 ක කටයුතු ක්‍රියාත්මක කර නොතිබුණි. ඒ අනුව දිවයිනේ විවිධ පළාත්වල සිදු කිරීමට අපේක්‍ෂා කළ නාගරික සංවර්ධන කටයුතු ක්‍රියාත්මක නොකිරීම නිසා එම ව්‍යාපෘති මගින් මහජනයාට ලබාගත හැකිව තිබූ ප්‍රතිලාභ තවදුරටත් ලබා ගැනිම ප්‍රමාද වී තිබුණි. එම ක්‍රියාත්මක නොකළ ව්‍යාපෘති සඳහා සලසා තිබුණු ප්‍රතිපාදනවලින් වෙනත් කාර්යයක් ඉටු කිරීමට තිබුණු අවස්ථා අහිමි කර තිබුණි.

(ඇ) **ඩෙංගු වැලැක්වීම සඳහා ඇලමාර්ග හා කාණු පිරිසිදු කිරීම.**

---------------------------------------------------------------

ඩෙංගු වැලැක්වීම සඳහා ඇලමාර්ග හා කාණු පිරිසිදු කිරීමට සමාලෝචිත වර්ෂයේදි පරිපූරක ඇස්තමේන්තු වෙන්කිරිම් මගින් රු.මිලියන 11.12 ක ප්‍රතිපාදන සලසා තිබුණි. නමුත් සමාලෝචිත වර්ෂයේදී ඇලමාර්ග හා කාණු පිරිසිදු කිරීම හෝ ඒ සම්බන්ධයෙන් කටයුතු ඉටුකර නොතිබුණු අතර සලසා තිබුණු මුළු ප්‍රතිපාදනයම ඉතිරි කර තිබුණි.

**3.7.2 මුදල් නිදහස් කර තිබුණද ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති**

-----------------------------------------------------------------

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) මහ කොළඹ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය**

-------------------------------------------------------

මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය යටතේ කොළඹ අගනගරයේ දෛනිකව රැස්වන ඝන අපද්‍රව්‍ය බැහැර කිරිම හා අපද්‍රව්‍ය කළමනාකරණය කිරිම සඳහා කොළඹ අගනගර ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතිය උපසංරචකයක් වශයෙන් කටයුතු කර තිබුණි. ඉන්පසු මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය යටතේ වෙනම ව්‍යාපාතියක් ලෙස ක්‍රියාත්මක කර තිබුණි. මෙම ව්‍යාපෘතියේ කටයුතු සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ඝන අපද්‍රව්‍ය කළමනාකරණයේදී සිදුවන පරිසර බලපෑම තක්සේරු කිරිම හා ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා ක්‍රියාකාරි සැලැසුමක් පිළියෙල කිරිමට ජාත්‍යන්තර උපදේශක ආයතනවල සහය ලබාගෙන තිබුණි. ඒ වෙනුවෙන් එම ආයතනවලට සමාලෝචිත වර්ෂය අවසානය වන විට කොළඹ අගනගර නාගරික සංවර්ධන ව්‍යාපෘතිය විසින් රු.මිලියන 65.92 ක් ගෙවා තිබුණි. ඒ අනුව තවදුරටත් එම ආයතනවලින් අතිරේක උපදේශන වාර්තාද ලබා ගැනීමට කටයුතු කර තිබුණි. කෙසේවුවද, විදේශ ආයතනවලින් ලබාගත් උපදේශක වාර්තාවලින් පෙන්වා දෙන කරුණු සහ නිර්දේශයන් ක්‍රියාත්මක කිරිමට හෝ ඒ සම්බන්ධයෙන් පළාත් පාලන ආයතන සමඟ සම්බන්ධීකරණයක් ඇති කර ගැනීමට ව්‍යාපාතිය අපොහොසත් වී තිබුණි.

(ii) සමාලෝචිත වර්ෂයේදී හා ඉකුත් වර්ෂයේදී භාණ්ඩාගාරය විසින් රු.මිලියන 4,000 ක ප්‍රතිපාදන අමාත්‍යාංශය වෙත ලබාදී තිබුණි. මෙම අපද්‍රව්‍ය කළමනාකරණ වැඩ පිළිවෙල ක්‍රියාත්මක කර ඉදිරියට ගෙනයාමට අමාත්‍යාංශය කටයුතු කර නොතිබූ බැවින් වාර්ෂික අයවැය ලේඛනය මගින් සලසා තිබුණු ප්‍රතිපාදනවලින් සියයට 99.9 ක්ම උපයෝජනය කර නොතිබුණි.

(iii) සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ව්‍යාපෘති අධ්‍යක්ෂවරයෙකු විධිමත් ලෙස පත්කර නොතිබුණි. අමාත්‍යාංශයේ නිලධාරීන් වැඩබැලීමේ පදනම මත පත්කරමින් ව්‍යාපෘතියේ කටයුතු ඉතා මන්දගාමීව සිදුකර තිබුණි.

(iv) එසේම සමාලෝචිත වර්ෂය අවසානය වන විට ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා අධ්‍යයන කටයුතු වෙනුවෙන් නිලධාරී විදේශ ගතවී රු.546,778 ක් ඒ වෙනුවෙන් වැයකර තිබුණි. නමුත් එකී අධ්‍යයන කටයුතු පිළිබඳව කිසිදු වාර්තාවක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) **සුඛිත පුරවර ව්‍යාපෘතිය යටතේ කොට්ටාව - මාලබේ පාර මීටර් 760 ක් වැඩිදියුණු කිරීම.**

---

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) කඩවත, කඩුවෙල, කොට්ටාව නගර සංවර්ධන ව්‍යාපෘතියේ (3 K ව්‍යාපෘතිය) කොන්ත්‍රාත් පැකේජ අංක 04 යටතේ කොට්ටාව මාලබේ පාරේ කුලසෙවන වත්ත නිවාස ව්‍යාපෘතිය දක්වා ද්විත්ව මාර්ගයක් ලෙස කි.මී.1.35 ක් දේශීය අරමුදල්වලින් සංවර්ධනය කිරීමට හඳුනාගෙන තිබුණි. කෙසේ වුවද දැනට මෙම මාර්ගය 3 K ව්‍යාපෘතිය යටතේ කි.මී.0.760 ක් එනම් කොට්ටාව බෝගහ හන්දියේ සිට අගහරුවාදා පොල දක්වා සංවර්ධනය කිරීමට රු.මිලියන 226 ක වියදම් ඇස්තමේන්තු දෙකක් සකස් කර තිබුණි. බස්නාහිර පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් සකස් කරන ලද වියදම් ඇස්තමේන්තුව අනුව කාණු ඉදිකිරීම සඳහා රු.මිලියන 24 ක් ඇස්තමේන්තු කර තිබුණි. නමුත් 3K ව්‍යාපෘතිය විසින් සකස් කළ වියදම් ඇස්තමේන්තුව අනුව කාණු ඉදිකිරීම සඳහා රු.මිලියන 33 ක් ඇස්තමේන්තු කර තිබුණි. ඒ අනුව ඉහත ආයතන දෙක විසින් ඉදිකරනු ලබන කානු කොටස් මොනවාද යන්න මෙම ආයතන අතර සමායෝජනය කර නොතිබීම නිසා වෙන වෙනම හඳුනාගත නොහැකි විය. මේ අනුව එකම ඉදිකිරීම් කටයුත්ත සඳහා දෙයාකාර ගෙවීමක් කිරීමට ඇති අවදානම සම්බන්ධව අමාත්‍යාංශය විසින් විධිමත් පියවර ගෙන නොතිබුණි.

(ii) සුඛිත පුරවර වැඩසටහන මඟින් යටිතල පහසුකම් සහ ඉඩම් පවරා ගැනීම සඳහා රාජ්‍ය ආයතන 05 කට රු.66,046,981 ක් ගෙවා තිබුණි. නමුත් 2017 ජුලි 11 දින වන විටත් කිසිදු මාර්ග ඉදිකිරීම් කටයුත්තක් සිදුකර නොතිබුණි. බස්නාහිර පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් පෙර නිමි කාණු ( Pre - Cast drain ) කොටස් 172 ක් සහ කාණු ආවරණ (Slab) 274 ක් වැඩබිමට රැගෙනවිත් අනාරක්ෂිතව රඳවා ගෙන තිබුණි.

(iii) ක්‍රියාකාරී සැලැසුම් අනුව 2016 වර්ෂය අවසාන වන විට මෙම ව්‍යාපෘතියේ සංරචකයේ භෞතික ප්‍රගතිය සියයට 75 ක් අපේක්ෂා කර තිබුණි. නමුත් 2016 වර්ෂයේ අමාත්‍යාංශයේ කාර්යසාධන වාර්තාව අනුව එම සැලැසුම් කළ කාර්යයන්ගෙන් එක් කොටසක ඉඩම් අත්පත් කරගැනීමේ කාර්ය පමණක් ඉටු කර තිබුණි.

(iv) මෙම මාර්ගය ධාවන පථ දෙකක් සහ වාහන නවතා තැබීමට අමතර තවත් ධාවන පථ දෙකක් සහිතව ඉදි කිරීමට සැලැසුම් කර තිබුණි. මෙම මාර්ගය මීටර් 760 ක් එනම් කිලෝමීටර් ¾ දුරක් පුළුල් කර සංවර්ධනය කිරීම සඳහා ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 346 ක් ලෙස ඇස්තමේන්තුගත කර තිබුණද, මාර්ග සංවර්ධන අධිකාරියේ මූලික

ඇස්තමේන්තු රේටයන් අනුව මෙහි පිරිවැය උපරිම වශයෙන් රු.මිලියන 125 ක් පමණ වී තිබුණි. මේ අනුව පිරිවැය ඇස්තමේන්තුව තාර්කික නොවන පදනමකින් පිළියෙල කර තිබුණි.

**3.8 කාර්යසාධනය**
---------------

2016 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරි සැලැස්ම අනුව අමාත්‍යාංශයේ කාර්ය සාධනය පිළිබඳව පහත සඳහන් නිරීක්‍ෂණයන් කරනු ලැබේ.

**(අ) ප්‍රතිපාදන උපයෝජනය**
-------------------------

ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව විසින් ක්‍රියාත්මක කළ යුතුව තිබුණු කොළඹ ප්‍රදේශයේ ගංවතුර වැලැක්වීමේ හා පරිසර ප්‍රවර්ධන ව්‍යාපෘතිය සහ මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති සඳහා 2016 වර්ෂයේදී රු.මිලියන 2,360 ක ප්‍රතිපාදන ලබාදී තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විට ඉන් රු.මිලියන 1,010.75 ක ප්‍රතිපාදන පමණක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව සලසා දී තිබුණු ප්‍රතිපාදනවලින් සියයට 57 ක් උපයෝජනය කර නොතිබුණි.

**(ආ) ප්‍රමාණවත් ලෙස ඉටුනොකළ ප්‍රධාන කාර්යයන්**
---------------------------------------------------

විශේෂ ව්‍යාපෘති සුචිත පුරවර - 2016 යටතේ කොළඹ, ගම්පහ හා කළුතර යන දිස්ත්‍රික්කවල ව්‍යාපෘති සඳහා රු.මිලියන 80 ක ප්‍රතිපාදන සලසා තිබුණි. ඒ අනුව කොළඹ දිස්ත්‍රික්කයේ රු.මිලියන 20.1 කට ඇස්තමේන්තු කර තිබුණු ව්‍යාපෘති 11 ක්ද, ගම්පහ දිස්ත්‍රික්කයේ ජා ඇල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ක්‍රියාත්මක කළ යුතුව තිබුණු රු.මිලියන 2 කට ඇස්තමේන්තු කළ ව්‍යාපෘතියක ක්‍රියාත්මක නොකර අතහැර දමා තිබුණි. එසේම එම ව්‍යාපෘති සම්බන්ධයෙන් සාක්‍යතා අධ්‍යයනයක් හෝ ප්‍රමාණවත් අධීක්‍ෂණයක් සිදු කර නොතිබුණු බව එම ව්‍යාපෘති සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීකෂාවේදී අනාවරණය විය. විස්තර පහත දැක්වේ.

**(i) රුක්මලේ මහා විද්‍යාලය වටා තාප්පය ඉදිකිරීම**
---------------------------------------------------

මෙම කාර්යය සඳහා රු.500,000 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර, 2016 දෙසැම්බර් 31 දින වන විට රු.402,855 ක් වැය කර තිබුණි. එම ව්‍යාපෘති සඳහා අවශ්‍ය සම්පූර්ණ ප්‍රතිපාදන නොලැබීම නිසා තාප්පයේ අඩක් පමණක් නිම කර පසුව ව්‍යාපෘතිය අතහැර තිබුණි. මේ නිසා ව්‍යාපෘතියේ අරමුණ සම්පූර්ණ කර නොගත් හා ඒ වෙනුවෙන් වැය කළ මුදල නිශ්කාර්ය වියදමක් බවට පත්වී තිබුණි.

(ii) **මහරගම හොරහේන මාර්ගයේ අංක 171 නිවස අසල සිට අංක 175/7 තෙක් අදාළ මාර්ගය සංවර්ධනය කිරීම**
-------------------------------------------------------------------------------

මෙම උප ව්‍යාපෘතිය සඳහා රු.1,999,372 ක වියදම් ඇස්තමේන්තුවක් සකස් කර තිබුණු අතර 2016 දෙසැම්බර් 31 දින වන විට රු.1,941,689 ක් වැය කර තිබුණි. එම ඇල මාර්ගය කඩුවෙල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශය දක්වා නිමකර තිබුණු නමුත් කඩුවෙල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ පිහිටි ඇල මාර්ගයකට සම්බන්ධ කර කාර්ය නිම

නොකිරීම නිසා ව්‍යාපෘතියෙන් බලාපොරොත්තු වූ ප්‍රතිඵලය ලබාගැනීමට නොහැකි වී තිබුණි.

**(ඇ) ව්‍යාපෘති හඳුනාගැනීමේ නිශ්චිත ක්‍රමවේදයක් නොතිබීම.**

**------------------------------------------------------------**

අමාත්‍යාංශයේ සැලසුම් අංශය හා මූල්‍ය අංශ මඟින් සකස් කරන ලද කාර්යසාධන වාර්තා අනුව ව්‍යාපෘති නම් කර ඇති ආකාරය එකිනෙකට වෙනස්වීම මත ව්‍යාපෘති වල කාර්යසාධන තක්සේරු කිරීමේ ගැටළු ඇති වී තිබුණි. තවද මූල්‍ය අංශයේ ව්‍යාපෘති වෙනුවෙන් යොදා තිබුණු ව්‍යාපෘති නාමයන් හා කාර්යසාධන අංශයේ සඳහන් වන නාමයන් අතර වෙනස්කම් පැවතීම හේතුවෙන් ව්‍යාපෘතිවල මූල්‍ය හා භෞතික කාර්යසාධනය සංසන්දනය කිරීමේදී ගැටළු ඇති වී තිබුණි. මූල්‍ය අංශය එක් එක් ව්‍යාපෘතිය යටතේ වෙන වෙනම කාර්යසාධනය පෙන්නුම් කර දක්වා තිබුණද, සැලසුම් අංශය විසින් ව්‍යාපෘති කිහිපයක් එක් ව්‍යාපෘතියක් යටතට ගෙන කාර්යසාධනය ඇගයීම කර තිබුණි.

## 3.9 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

**----------------------------------**

අමාත්‍යාංශය විසින් සිදුකර තිබුණු ඇතැම් ගනුදෙනු මතභේදාත්මක ස්වරූපයේ ඒවා විය. නියැදි විගණන පරීක්ෂාවලදී අනාවරණය වූ එවැනි ගනුදෙනු කීපයක් පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) චක්‍රලේඛ වැරදි ලෙස අර්ථකථනය කරමින් මහා භාණ්ඩාගාරයේ උපදෙස්වලට පටහැනිව කඩවත, කඩුවෙල, කොට්ටාව නගර සංවර්ධන ව්‍යාපෘතියේ (3K ව්‍යාපෘතිය) කාර්ය මණ්ඩලයේ නිලධාරීන් 10 දෙනෙකුට රු.1,906,200 ක් හිඟ වැටුප් ලෙස ගෙවා තිබුණි. නමුත් එම අනුකූල නොවූ ගෙවීම් අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි.

**(ආ)** රජය විසින් ඉදිකර තිබුණු නිවාස ඒකක 5,203 ක් අදාළ නිවාසලාභීන් වෙත භාර දීමේදී එක් නිවාසලාභියෙකුගෙන් රු.100,000 ක් බැගින් අයකර ගැනීමට රජය තීරණය කර තිබුණි. නමුත් එම නිවාසලාභීන් විසින් ගෙවිය යුතු මුදල 2015 අතුරු අයවැය යෝජනා අනුව රජය විසින් ගෙවීමට තීරණය කර තිබුණි. මේ නිසා රජයට අතිරේක වියදමක් කිරීමට සිදු වී තිබුණි. මේ පිළිබඳව අමාත්‍යාංශය විසින් රජයට උපදෙස් දී නොතිබුණු අතර නිවාස ව්‍යාපෘතියේ ව්‍යාපාර සැලැස්ම පිළිබඳව අවධානය යොමු කර නොතිබුණි.

## 3.10 අවිධිමත් ගනුදෙනු

**-----------------------**

අමාත්‍යාංශය විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොර විය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

**(අ) බස්නාහිර කලාපීය මහානගර සැලැස්ම පිළියෙල කිරීම**

**----------------------------------------------------------**

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2004 වර්ෂයේදී පිළියෙල කර තිබුණු බස්නාහිර කලාපීය මහානගර සැලසුම් ව්‍යාපෘතිය සඳහා 2003 වර්ෂයේ සිට 2005 වර්ෂය දක්වා රු.මිලියන 79.85 ක් වැය කර තිබුණි. එම

ව්‍යාපෘතියේ සැලැසුම් මූලධර්ම වර්තමානයට නොගැලපීම නිසා නව සැලැසුමක් පිළියෙල කිරීමට කටයුතු කර තිබුණි. මේ නිසා, මහනගර සැලැසුම පිළියෙල කිරීම සඳහා වැයකර තිබුණු රු.මිලියන 79.85 ක මුදල නිෂ්ඵල වියදමක් වී තිබුණි.

(ii) බස්නාහිර කලාපීය මහනගර සැලසුම් පිළියෙල කිරීම භාර ව්‍යාපෘති කාර්යාලයට නාගරික සංවර්ධන අධිකාරියෙන් ලබාදුන් මුදලින් පරිගණක යන්ත්‍ර කිහිපයක් මිලදී ගෙන තිබුණි. ඊට අතිරේකව මසකට රු 25,000.කුලී පදනම මත පරිගණ 03ක් ලබාගෙන තිබුණි .එසේම ලැප්ටොප් පරිගණකයක් රු. 9,500 ක් බැගින් කුලී පදනම මත ලබාගෙන තිබු අතර එම කාර්යය වෙනුවෙන් 2015 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා වාහන කුලි ලෙස රු.721,450 ක් වැය කර තිබුණි.

(iii) බස්නාහිර කළාපීය මහනගර සැලැසුම් කිරීමේ ව්‍යාපෘතියේ අතිරේක ව්‍යාපෘති අධ්‍යක්‍ෂකවරයකු ලෙස පත් කරන ලද නිලධාරියකුට රාජකාරි හා පෞද්ගලික කටයුතු සඳහා ව්‍යාපෘතියෙන් වාහන ලබාදීමට නොහැකි වුවත්, රියදුරෙකු සහිතව වාහනයක් ව්‍යාපෘතියෙන් එම අධ්‍යක්ෂවරයාට ලබාදි තිබුණිඑම . වාහනයේ කුලිය, රියදුරු අතිකාල හා බටා වෙනුවෙන් සමාලෝචිත වර්ෂය අවසානය වන විට රු 2,037,017.ව්‍යාපෘතියෙන් වියදම් කර තිබුණි .

(iv) බස්නාහිර කළාපීය මහානගර සැලැසුම් ව්‍යාපෘතියේ නිලධාරින්ගේ විදේශ ගමන් සඳහා එකතුව රු.9,454,858 ක් වැයකර තිබුණි. එම වියදම තුළ චක්‍රලේඛවලට පටහැනි ගෙවීම්, හිමිකම් නොලබන ගෙවීම් හා වැඩිපුර ගණනය කිරීම් පවතින බව 2016 ඔක්තෝම්බර් 28 දිනැති අංක MMWD/F/02/WRMO 11 දරන අමාත්‍යාංශයේ ලේකම්ගේ ලිපිය මඟින් අනාවරණය කර තිබුණි. එමෙන්ම ව්‍යාපාරික පන්තියේ ගුවන් ගමන්වල යෙදීමට හිමිකමක් නොමැති නිලධාරීන්ට එම පංතියේ ගමන් කිරිමට ගුවන් ගමන් ටිකට්පත් මිලදි ගැනීම, නිලධාරින්ගේ විදේශ ගමන්වල අරමුණු සහ විදේශ ගමනින් රටට අත්වන ප්‍රතිලාභ පිළිබඳ තොරතුරු නොතිබිම, විදේශ ගමන්වලින් පසු ඒ පිළිබඳ අදාළ නිලධාරීන්ට වාර්තා ඉදිරිපත් නොකිරීම හා විදේශ ගමන් දීමනා සඳහා යැපීම් දීමනා ගණනය කිරීම්වල අඩුපාඩු නිරීක්‍ෂණය විය.

## 3.11 ආර්ථික නොවන ගනුදෙනු

----------------------------

මහනගර සැලැස්ම එළිදැක්වීම සඳහා පවත්වා තිබුණු උත්සවය වෙනුවෙන් පමණක් ව්‍යාපෘති කාර්යාලය විසින් රු.7,844,183 ක ප්‍රමාණාත්මක මුදලක් සැකසුරුවම් නොවන පරිදි වැයකර තිබුණි.

## 3.12 කළමනාකරණ දූර්වලතා

----------------------------

අමාත්‍යාංශය විසින් සිදු කර තිබුණු ගනුදෙනු සම්බන්දයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් කළමනාකරණ අඩුපාඩු අනාවරණය විය.

**(අ) නාගරික ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය වෙනුවෙන් කිසිදු ව්‍යාපෘතියක් ආරම්භ කර නොතිබීම**

---

මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශයේ නගර උපාංග සංවර්ධන හා නාගරික ඝන අපද්‍රව්‍ය කලමනාකරණය වෙනුවෙන් 162-02-03-2502(16) දරන වැය විෂය යටතේ 2016 වර්ෂයේදි ප්‍රතිපාදන සලසා තිබුණි. එම වැය විෂය සඳහා ලබා දී තිබුණු ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම නිසා පරිපූරක ඇස්තමේන්තු වෙන්කිරීම් බලපත්‍ර 14 ක් මගින් රු.මිලියන 4,350.2 ක අතිරේක ප්‍රතිපාදන ලබා ගෙන තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විට එම ප්‍රතිපාදනවලින් රු.මිලියන 3,330.8 ක් නගර උපාංග සංවර්ධනය වෙනුවෙන් වැය කර තිබුණි. නමුත් බස්නාහිර පළාතේ ප්‍රමුඛ හා හදිසි අවශ්‍යතාවයක් වූ ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා සළසා තිබුණු ප්‍රතිපාදනවලින් කිසිදු උපයෝජනයක් කර නොතිබුණි.

**(ආ) වේරස්ගඟ ව්‍යාපෘතිය**

---

ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව විසින් වේරස් ගඟේ වැසි ජලය අපවාහනය සහ පරිසර වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ජාතික ඉතිරිකිරීමේ බැංකුවෙන් රු.මිලියන 14,000 ක ණය මුදලක් ලබාගැනීමට තිරණය කර තිබුණි. එම ණය මුදලෙන් රු.මිලියන 2,550 ක් සමාලෝචිත වර්ෂයේදී ලබාගෙන තිබුණි. එකී ණය මුදල වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී ගෙවිය යුතු පොලී සහ ණය වාරිකවල වටිනාකම වූ රු.මිලියන 726.54 ක් ණය ගිවිසුම අනුව නියමිත දිනයන්හි ගෙවීමට අමාත්‍යාංශය අපොහොසත් වී තිබුණි. මේ නිසා බැංකුව විසින් ණය මුදලේ ඉතිරි ශේෂය වන රු.මිලියන 11,429 ක් ලබාදීම අත්හිටුවා තිබුණි. ඉදිරි ව්‍යාපෘති වියදම් වාර්ෂිකව අයවැය ඇස්තමේන්තුවෙන් ලබාදෙන ප්‍රතිපාදන අනුව කළමනාකරණය කර ගත යුතු බව අමාත්‍ය මණ්ඩලය විසින් තීරණය කර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේදී 162-2-3-9-2502 (11) වැය විෂය යටතේ ලබාදී තිබුණු රු.මිලියන 1,000 ක ප්‍රතිපාදනවලින් රු.මිලියන 218 ක් හෙවත් සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 22 ක් පමණක් වැයකර තිබුණි.

**(ඇ) බේරේ වැව ප්‍රතිසංස්කරණ හා ප්‍රතිසංවර්ධන ව්‍යාපෘතිය**

---

2016 ඔක්තෝබර් 28 දිනැති අමාත්‍ය මණ්ඩලයේ තීරණය අනුව බේරේ වැව ප්‍රතිසංස්කරණ හා ප්‍රතිසංවිධාන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමටත්, ව්‍යාපෘතියේ කටයුතු දියත් කිරීමට ඉඩම් නිදහස් කර ගැනීම හා හදිසි පුනරුථාපන කටයුතු කළ යුතුව තිබුණි. ඒ සඳහා මුලිකව රු.මිලියන 1,350 ක ප්‍රතිපාදන මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය වෙත ලබා දි තිබුණි. සමාලෝචිත වර්ෂයේදී ඉන් රු.මිලියන 1,200 ක් නාගරික සංවර්ධන අධිකාරිය වෙත ලබා දී තිබුණි. විධිමත්ව සමීක්ෂණයක් පවත්වා අවසන් වශයෙන් සමාලෝචනය කිරීමෙන් පසු නිශ්චිතව නිවාස සඳහා හිමිකම් ලබන සංඛ්‍යාව හඳුනාගෙන, අවශ්‍ය ප්‍රතිපාදන ඉල්ලුම් කළ යුතුව තිබුණද, ඒ අයුරින් කටයුතු නොකර මුලික ක්ෂේත්‍ර සමීක්ෂණයේ තොරතුරු මත පමණක් පදනම්ව ප්‍රතිපාදන ඉල්ලුම්කර තිබීම නිසා වැඩිපුර ප්‍රතිපාදන ඉල්ලුම්කර තිබුණු බව නිරීක්ෂණය විය.

**(ඈ) බස්නාහිර කළාපීය මහානගර සැලැස්ම පිළියෙල කිරීම**

බස්නාහිර කළාපීය මහා නගර සැලැස්ම පිළියෙල කිරීමෙන් පසු අදාළ පළාත් පාලන ආයතනවල විෂය පථය කෙරෙහි වන බලපෑම ඉවත් කිරීම සඳහා පළාත් පාලන ආයතනවලට අදාළ අණ පනත් සංශෝධනය කිරීම බස්නාහිර කළාපීය මහ නගර අධිකාරියෙන් අපේක්ෂා කර තිබුණි. ඒ අනුව බස්නාහිර කළාපීය මහානගර අධිකාරියේ ව්‍යුහය තීරණය කිරීම සඳහා කළාපීය මහානගර අධිකාරිය පිහිටුවීමේ කෙටුම්පත පිළියෙල කළ යුතුව තිබුණි. නමුත් එසේ නොකර ගොඩනැගිලි සැලසුම් රෙගුලාසි පිළියෙල කිරීම , විද්‍යා හා තාක්‍ෂණ නගර සැලසුම් සැකසීම, හොරණ හා මීරිගම කාර්මික නගර සැලැසුම පිළියෙල කිරීම වැනි සැලැසුම් පිළියෙල කිරීමට යොමු වී තිබුණි. 2016 මාර්තු 10 දිනැති අංක අමප/16/321/724/016 දරන අමාත්‍ය මණ්ඩල තීරණයෙහි 1(ii) ඡේදය ප්‍රකාරව බස්නාහිර කළාපීය මහනගර අධිකාරිය පිහිටුවීම පිණිස කඩිනමින් අවශ්‍ය කටයුතු කරන ලෙසට මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්වරයාට නියමකර තිබුණි. කෙසේ වුවද එම අමාත්‍ය මණ්ඩල තීරණය ලැබී සමාලෝචිත වර්ෂය අවසන් වන විට වර්ෂයකට වැඩි කාලයක් ඉකුත් වී තිබුණද, බස්නාහිර කළාපීය මහනගර අධිකාරිය පිහිටුවීමට අවශ්‍ය මූලික ලියවිලි පිළියෙල කර නොතිබුණි.

**(ඉ) ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම**

නාගරික සංවර්ධන අධිකාරිය විසින් මධ්‍යම පළාතේ සහ බස්නාහිර පළාතේ ක්‍රියාත්මක කිරීමට සැලැසුම් කර තිබුණු ව්‍යාපෘති 04 ක් සඳහා එකතුව රු. මිලියන 409 ක ප්‍රතිපාදන සලසා තිබුණි. එම ව්‍යාපෘති වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදි රු.මිලියන 8.2 ක් වැයකර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී එම ව්‍යාපෘති අවලංගු කිරීම නිසා වැයකර තිබුණු රු.මිලියන 8.2 ක වියදම නිස්ඵල වී තිබුණි.

**(ඊ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියා පටිපාටියෙන් බැහැරවීම**

තෙත්බිම් කළමනාකරණය කිරීමේ උපායමාර්ගික සැලැස්ම පිළියෙල කිරීම සහ කොළඹ නගරය ආශ්‍රිත පළාත තුළ ඇති අභ්‍යන්තර ජලමාර්ගවල සහ වැව්වල ජලයෙහි ගුණත්වය පිළිබඳ ඇගයීමක් කිරීම යන කාර්යයන් සඳහා ව්‍යාපෘති කළමනාකරණ ඒකකය ජාත්‍යන්තර උපදේශක ආයතනවලින් ලංසු කැඳවා තිබුණි. ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් සකස් කර තිබුණු උපදේශකයන් තෝරා ගැනිමේ නිර්නායකයන්ට අනුව සුදුසුකම් ලැබු පළමු ආයතනයට අදාළ කොන්ත්‍රාත්තුව ප්‍රදානය නොකර, දෙවනුව සුදුසුකම්ලත් ආයතනය වෙත කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි. සුදුසුකම් ලැබූ පළමු ආයතනය තෝරා නොගැනීමට අදාළ තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**3.13** **මානව සම්පත් කළමනාකරණය**

**----------------------------------**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

**------------------------------------------------------**

2016 දෙසැම්බර් 31 දිනට වු සේවක සංඛ්‍යාව පිළිබඳ තත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 31 | 25 | 06 |
| (ii) | තෘතියික මට්ටම | 04 | 02 | 02 |
| (iii) | ද්විතියික මට්ටම | 93 | 48 | 45 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 43 | 34 | 09 |
| (v) | වෙනත් (අනියම්/ කොන්ත්‍රාත් පදනම මත/ තාවකාලික) | 05 | 01 | 04 |
| | **එකතුව** | **176** | **110** | **66** |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අමාත්‍යාංශය යටතේ මහානගර සැලැසුම් ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය කාර්ය මණ්ඩලය තීරණය කිරීම, එකී කාර්ය මණ්ඩලයේ එක් එක් තනතුර සඳහා අවශ්‍ය සුදුසුකම් තීරණය කිරීම, බඳවා ගැනීම හා පාරිශ්‍රමික තීරණය කිරීම සම්බන්ධයෙන් පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

(i) ව්‍යාපෘති සඳහා අවශ්‍ය තනතුරු හා කාර්ය මණ්ඩලය තීරණය කර ඒ සඳහා පූර්ව අනුමැතීන් හෝ ආවරණ අනුමැතින් ලබාගෙන නොතිබුණි.

(ii) තනතුරු සඳහා නිලධාරින් බඳවාගැනීමේ සාමාන්‍ය ක්‍රමවේදය අනුගමනය කර නොතිබුණි.

(iii) ව්‍යාපෘතියේ විවිධ තනතුරු සඳහා කිසියම් පදනමක් මත වැටුප් පරිමාණ තීරණය කර නොතිබුණි.

(iv) ප්‍රමාණවත් පළපුරුදු හා වෘත්තීය සුදුසුකම් ලබානොගත් නිලධාරින් සහයක උපදේශකයින් ලෙස බඳවාගෙන ඉහළ වැටුප් ගෙවා තිබුණි.

(v) ව්‍යාපෘතිය සඳහා බඳවාගත් උපදේශකයන්ගෙන් ලබාගන්නා උපදේශාත්මක සේවා සහ කොන්දේසි (Terms of Reference) පිළියෙල කර නොතිබුණු අතර එසේම ඇතැම් උපදේශකයන්ගෙන් ලබාගැනීමට අපේක්ෂා කර තිබුණු වාර්තා නියමිත දිනවලදී ව්‍යාපෘතිය වෙත ඉදිරිපත් කර නොතිබුණත්, ඒ කෙරෙහි අවධානය යොමු නොකර ඔවුන්ගේ උපදේශක කොන්ත්‍රාත්තු කාලීනව දීර්ඝ කර තිබුණි.

(vi) වයස අවුරුදු 60 ඉක්ම වූ නිලධාරින්ද ව්‍යාපෘතියේ සේවය සඳහා යොදා ගැනීමට චක්‍රලේඛ ප්‍රතිපාදන අනුව හැකියාවක් නොතිබුණද, යථෝක්ත ව්‍යාපෘති සඳහා වයස අවුරුදු 60 ඉක්මවූ නිලධාරින් 04 දෙනෙකු සේවයේ යොදවාගෙන තිබුණි.

(vii) මහානගර සැලැස්ම පිළියෙල කිරීමේ ව්‍යාපෘතිය සඳහා බඳවාගන්නා ලද උපදේශකයින් සහ නිලධාරින් සඳහා රැස්වීම් දීමනා ලෙස රු.2,500, රු.4,000, රු.10,000 සහ රු.30,000 වශයෙන් ගෙවීම්කර තිබුණි. එසේම ඇතැම් නිලධාරින්ට උදය සහ හවස රැස්වීම් දෙකක් ලෙස සලකා එකම දීමනා දෙකක් ගෙවීම් කර තිබුණි. එකිනෙකට වෙනස් දීමනා ගෙවීම සඳහා පදනමක් නොතිබුණු අතර එකී දීමනා ගෙවීම සඳහා විධිමත් අනුමැතියක්ද ලබාගෙන නොතිබුණි.